ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
| දිනය | 2017 ජූලි 13 |

## මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ විසිවන වාර්ෂික සමුළුව
## කොළඹ, ශ්‍රී ලංකාව
## 2017 ජූලි 17 සිට 21 දක්වා

මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ විසිවන වාර්ෂික සමුළුව, සාමාජික රටවල් 41ක් සහ විවිධ අන්තර්ජාතික නිරීක්ෂණ සංවිධාන රැසක නියෝජනය සහිත දේශීය සහ විදේශීය ආරාධිතයන් 450කගේ පමණ සහභාගීත්වයෙන් 2017 ජූලි මස 17 සිට 21 දක්වා කොළඹදී පැවැත්වේ. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහභාගී වේ.

මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම ශ්‍රී ලංකාව ඇතුළු තවත් රටවල් 13ක ප්‍රධානත්වයෙන් 1997 වසරේදී තායිලන්තයේ බැංකොක්හිදී ආරම්භ කරන ලදී. මෙම කලාපීය කණ්ඩායම සිය සාමාජික රටවල මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිණිස ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ 40 ක්‍රමවත් අයුරින් ස්ථාපනය කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳව නිරීක්ෂණය කරනු ලබයි. මේ වන විට, ශාන්තිකර කලාපීය කුඩා ආර්ථිකයන්ගේ සිට ඇමෙරිකා එක්සත් ජනපදය, චීනය, ජපානය සහ ඉන්දියාව වැනි විශාල ආර්ථිකයන්ද මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සාමාජිකත්වය දරයි. ස්ථිර සාමාජික රටවලට අමතරව මූල්‍ය කාර්ය සාධක බලකාය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය

පිළිබඳ සංවිධානය, මත්ද්‍රව්‍ය සහ අපරාධ සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය, ආසියානු සංවර්ධන බැංකුව සහ මූල්‍ය බුද්ධි ඒකකයන්ගේ එකතුවෙන් සැදුම්ලත් එග්මොන්ට් කණ්ඩායම වැනි ජාත්‍යන්තර මෙන්ම කලාපීය සංවිධාන නියෝජනය වන නිරීක්ෂකයන් පිරිසක්ද මෙවර වාර්ෂික සමුළුවට සහභාගී වේ.

මූල්‍ය කාර්ය සාධක බලකායට සමගාමීව පිහිටුවා ඇති ලොව විශාලතම කලාපීය සංවිධානය ලෙස ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම ගෝලීය වශයෙන් නිරන්තරව වෙනස්වන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම් වැළැක්වීමට අදාල ක්‍රම සහ විධි හඳුන්වා දීම පිණිස ඉතා අගනා කාර්යභාරයක් ඉටු කරනු ලබයි. 2012 වසරේදී සංශෝධනය කරන ලද මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ 40 අනුව සිය සාමාජික රටවල් පිළිබඳව සිදු කරනු ලබන අන්‍යෝන්‍ය ඇගයීම් හරහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන එක් එක් රටවල්වල අනුකූලතාවය ඇගයීමට ලක් කෙරේ. පුළුල් පරාසයක් තුළ පැතිරුණු ආරක්ෂාකාරී ක්‍රමවේදයන්, පවතින ආයතනික රාමුව, නීතිය බලාත්මක කිරීම සහ නඩු පැවරීම සම්බන්ධ ගැටළු, මූල්‍ය නොවන අංශ සඳහා වන පාලන ක්‍රම, අපරාධයන්ට අදාළව දේපළ රාජසන්තක කිරීම් සහ ගිණුම් අත්හිටුවීම් සඳහා අවශ්‍ය වන අන්‍යෝන්‍ය සහාය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය ලබා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව තක්සේරු කිරීමක් මෙහිදී සිදු කරනු ලැබේ.

අන්‍යෝන්‍ය ඇගයීම් හැරුණු විට, වර්තමානයේ සිදුවන මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම සඳහා අනුගමනය කරන ක්‍රමවේදයන් සහ එහි ඇති අවදානම් තත්ත්වයන් සම්බන්ධව සිය සාමාජික රටවලට සහ මහජනතාවට දැනුවත් කිරීම සඳහා තාක්ෂණික සහාය, පුහුණුවීම් සහ උපාය මාර්ග අධ්‍යයන කිරීමට අවස්ථාව ලබාදීම මඟින් ද මෙම කණ්ඩායම සිය සාමාජික රටවලට සහාය ලබාදෙයි. තවද, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා ඇති සම්පත් නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම සඳහා ජාතික සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් ස්ථාපනය කිරීමටද මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම සිය සාමාජිකයින්ට සහාය වෙයි.

අන්තර්ජාතික සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කිරීම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා එක් එක් රටවල අනුකූලතා මට්ටම සමාලෝචනය කිරීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් හඳුනාගත් දුර්වලතාවයන් මඟ හැරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා මෙම විසිවන වාර්ෂික සමුළුව සාමාජික රටවලට ඉතා ප්‍රයෝජනවත් වේ. තවද, 2016-2018 වර්ෂයන් සඳහා මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා

ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සම-සභාපතීත්වය ශ්‍රී ලංකාව විසින් දරන බැවින් මෙම වාර්ෂික සමුළුව ශ්‍රී ලංකාවට අතිශය වැදගත් වේ. එසේම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව කටයුතු කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ ඇති කැපවීම තහවුරු කිරීම සඳහා මෙය අනගි අවස්ථාවක් වනු ඇත. වාර්ෂික සමුළුවේ පෙර සැසි වාරයන් 2017 ජූලි 15 වන සෙනසුරාදා සිට පැවැත්වීමට නියමිතය.